# පුස්තකාල දැනුම සංවිධාන ප්‍රමිති පිළිබඳ හැඳින්වීමක්.

ආර්.එම්.ඩී.පී. රත්නායක*

**සංක්ෂේපය**

පුස්තකාලයක සිදුවන කටයුතු අනුව දැනුම සංවිධානය සඳහා වැදගත් ස්ථානයක් හිමි වේ. පුස්තකාලයක සතු වන දැනුම මනාව සංවිධානය කර පාඨකයා වෙත නියමිත ආකාරයට ලබා දීමට නම් දැනුම සංවිධානය පිළිබඳ පුස්තකාල ප්‍රමිති භාවිත කිරීම ඉතා වැදගත් කරුණකි. දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති අතර වර්ගීකරණ ප්‍රමිති සහ සූචිකරණ ප්‍රමිති ප්‍රමුඛ ගණයෙහි ලා සැලකේ. මීට අමතරව අනුක්‍රමණිකා සඳහා වන ප්‍රමිති, විෂය ශීර්ෂ ලැයිස්තු පිළිබඳ ප්‍රමිති, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ ප්‍රමිති, ග්‍රන්ථ සංසරණය සඳහා වන ප්‍රමිති, අක්ෂර පරිවර්තනය පිළිබඳ ප්‍රමිති සහ සාධිකාරී ලේඛන පිළිබඳ ප්‍රමිති ද වැදගත් කොට සැලකේ. පුස්තකාලවල දැනුම සංවිධානය කිරීම සඳහා යොදා ගන්නා ප්‍රමිති පිළිබඳව මෙහි දී සාකච්ඡා වේ.

## හැඳින්වීම

පුස්තකාලය යනු දැනුම කේන්ද්‍ර කරගත් තොරතුරු මධ්‍යස්ථානයකි. එස්.ආර්. රංගනාදන් පුස්තකාල විශේෂඥයාගේ පංච නීතිය අනුව පාඨකයාට අවශ්‍ය තොරතුරු අවශ්‍ය වේලාවට අවශ්‍ය ආකාරයට ලබා දීමට නම් පුස්තකාලය සතු දැනුම මනාව සංවිධානය කළ යුතුය. අවශ්‍ය තොරතුරු නියමිත ස්ථානයෙන් කෙටි වේලාවක දී ලබා ගැනීමට නම් දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති භාවිතය අත්‍යවශ්‍ය කරුණකි. වර්ගීකරණය, සූචිකරණය, අනුක්‍රමණිකාකරණය, විෂය ශීර්ෂ ලැයිස්තු, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ ප්‍රමිති, ග්‍රන්ථ සංසරණය, අක්ෂර පරිවර්තන ක්‍රම සහ සාධිකාරී ලේඛන වැනි තාක්ෂණික හා ප්‍රලේඛන සේවා ප්‍රමිති පුස්තකාලයක දැනුම සංවිධානය සඳහා වැදගත් ප්‍රමිති ලෙස දැක්විය හැකිය. පුස්තකාලයක විනිවිද දැකිය හැකි කැඩපතක් ලෙස ද පුස්තකාල දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති හඳුන්වා දිය හැකිය. පුස්තකාල සතු දැනුම සංවිධානයේ සාර්ථකත්වය, කාර්යක්ෂමතාව මෙන්ම ගුණාත්මකභාවය ද පිළිබිඹු වන මෙවලමක් ලෙස ද පුස්තකාල දැනුම සංවිධාන ප්‍රමිති හඳුන්වා දිය හැකිය.

## අරමුණු

මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වන්නේ දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති ගවේෂණය කිරීමටය. ඒ ඒ ප්‍රමිති පිළිබඳ ප්‍රමාණාත්මක විස්තරයක් මෙන්ම එම ප්‍රමිති සම්පාදනය කළ කතුවරුන්, ආයතන නිර්මාණය වූ කාල පරිච්ඡේද සහ සංස්කරණ පිළිබඳව ද තොරතුරු විමර්ශනය කෙරේ.

*තාවකාලික කථිකාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, dhammikarathnayaka75@gmail.com

**සාහිත්‍ය විමර්ශනය**

පුස්තකාල දැනුම සංවිධානය පිළිබඳ සාහිත්‍ය විමර්ශනය කිරීමේ දී විශාල සාහිත්‍යක් ඒ වටා ගොඩනැගී ඇති බව පෙනී යන කරුණකි. මෙහි දී සාකච්ඡා කරනුයේ ඉන් කිහිපයක් පමණි. එම්.පී. සතීජා පුස්තකාලවේදියා විසින් රචිත **"The Theory of and Practices of Dewey Decimal Classification System"** නම් වූ කෘතිය, මහාචාර්ය පියදාස රණසිංහයන් පරිවර්තනය කළ (2012) **ඩිවි දශම වර්ගීකරණයේ න්‍යාය සහ භාවිතය** නම් කෘතියේ දී ඩිවි දශම වර්ගීකරණයේ 22 වැනි සංස්කරණය (2003) පාදක කර ගනිමින් එහි භාවිතය සහ න්‍යායත් වසර 135 ක් පමණ වූ ඉතිහාසයත් සංක්ෂිප්තව දක්වා ඇත. වර්ගීකරණයේ සැකැස්ම, විකාශනය, සංස්කරණ කටයුතු ආදී ක්ෂේත්‍ර රාශියක් ඔස්සේ කරුණු ගොනු කොට ඇත. **විෂය සුචිකරණය හා අනුක්‍රමණිකාකරණය** නම් කෘතිය රචනා කළ මහාචාර්ය පියදාස රණසිංහයන් (2007), තම කෘතියේ දී අනුක්‍රමණිකා පිළිබඳ ප්‍රමිති විග්‍රහ කර ඇත. එමෙන්ම විෂය සුචිකරණය පිළිබඳව ද කරුණු ගොනු කර ඇත. මුද්‍රිත විෂය ශීර්ෂ ලැයිස්තු සහ පර්යාය පද කෝෂ පිළිබඳව ද තොරතුරු විස්තර කරයි.

පුස්තකාල වර්ගීකරණ ප්‍රමිති සකස් වී ඇත්තේ ඥානය හෙවත් දැනුම පදනම් කරගෙන බව 'ක්‍රිෂන් කුමාර්' (Krishan Kumar) රචනා කළ 'Theory of classification' කෘතියේ සහ 1977 දී 'ඒ. කේ. ඔඩියර්' (A.K. Ohdear) විසින් රචනා කරන ලද 'Library classification' නම් කෘතිය මඟින් පෙන්වා දී තිබේ.

“Glossary of library science technical terms” නමින් 1980 දී පී.එන්. ගෝ(ර්) (P.N.Gour) විසින් රචනා කළ කෘතියේ ද ප්‍රමිතියක් යන්න නිර්වචනය කර ඇත. ඔහු විසින් “Standard schemes of Classification” නමින් වර්ගීකරණ ප්‍රමිතීන් යම් පිළිවෙළකට සකස් කර ඇත්තේ පහත අයුරෙනි.

1. බ්‍රිතාන්‍ය කෞතුකාගාර වර්ගීකරණය (British Museum Classification) - 1836
2. ඩිවි දශම වර්ගීකරණය (Dewey Decimal Classification) - 1876
3. චාල්ස් අම්මි කටර්ගේ ව්‍යාප්ත වර්ගීකරණය (Charles Ammi Cutter’s Expansive Classification) - 1879-1901
4. ජේම්ස් ඩෆ් බ්‍රවුන්ගේ සීමා මාරු වර්ගීකරණය (James Duff Brown’s Adjustable Classification) - 1898
5. කොංග්‍රස් පුස්තකාල වර්ගීකරණය (Library of Congress Classification) - 1901
6. විශ්ව දශම වර්ගීකරණය (Universal Decimal Classification) - 1905
7. ජේ.ඩී. බ්‍රවුන්ගේ විෂය වර්ගීකරණය (J.D. Brown’s Subject Classification) - 1906
8. හෙන්රි ඉව්ලි බ්ලිස්ගේ ග්‍රන්ථ විද්‍යාත්මක වර්ගීකරණය (Henry Evely Bliss’s Bibliographic Classification) - 1933
9. දෙතිත් වර්ගීකරණය (Colon Classification) - 1933

කොරෙයා (Corea, 1978) විසින් රචනා කරන ලද "A manual for Public libraries in Sri Lanka" නම් ග්‍රන්ථයෙහි සමස්ත මහජන පුස්තකාල පද්ධතිය සඳහා ම පුස්තකාල ප්‍රමිති යොදා ගන්නා ආකාරය සාකච්ඡා කොට ඇත. ඒ අනුව පුස්තකාල ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ හා උපකරණ, පොත් එකතුව සංවිධානය, සූචිකරණය හා වර්ගීකරණය සහ පරිපාලනය සඳහා ගැළපෙන මාර්ගෝපදේශක කෘතියක් ලෙස රචනා වී ඇතත් මෙහි විස්තර වන්නේ පුස්තකාලයක් සඳහා වන ප්‍රමිතීන් ය. මහජන පුස්තකාල සඳහා මෙය රචනා වුවත් අනෙකුත් පුස්තකාල සඳහා ද මෙම ප්‍රමිති යොදා ගත හැකි බව පෙන්වා දිය හැක.

ශ්‍රීනිධි (Sreenidhi, 1996) විසින් සංස්කරණය කරන ලද "Library Standards" නම් ග්‍රන්ථයෙහි පුස්තකාල ප්‍රමිති පිළිබඳ හැඳින්වීමක් කර ඇත. පුස්තකාල සඳහා වන ප්‍රමිති, පුස්තකාල හා විඥාපන විෂය ක්ෂේත්‍රයේ තාක්ෂණික ප්‍රමිති, විශ්වවිද්‍යාල පුස්තකාල ප්‍රමිති, මහජන පුස්තකාල ප්‍රමිති, පාසල් සඳහා වන පුස්තකාල ප්‍රමිති යන ක්ෂේත්‍ර පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇත. මීට අමතරව විවිධ රටවල්වලට අදාල ප්‍රමිති පිළිබඳවත් අවධානය යොමු කර ඇත. එසේම විවිධ වූ තොරතුරු මාධ්‍ය සඳහා වන ප්‍රමිති පිළිබඳවත් කරුණු ඉදිරිපත් කර ඇත.

අලහකෝන්ගේ (2003) "පාසල් පුස්තකාල කළමනාකරණය" කෘතියේ වර්ගීකරණය, සූචිකරණය සහ පුස්තකාල එකතුව පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි. වර්ගීකරණ ප්‍රමිති යටතේ ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය, දෙතිත් වර්ගීකරණය සහ කොංග්‍රස් පුස්තකාල වර්ගීකරණය වැනි ප්‍රමිති, සූචිකරණ ප්‍රමිති යටතේ දී අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ විද්‍යාත්මක අංකය (ISBN), ඇන්ග්ලෝ-ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය-2 (AACR-II), සූචි පත්‍රයක ව්‍යූහය වැනි ප්‍රමිති සහ ලෙජර්, බ්‍රවුන්, පත්‍රිකා ක්‍රමය වැනි ග්‍රන්ථ සංසරණ ප්‍රමිති ද විස්තර කොට ඇත. ග්‍රන්ථය අවසානයේ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය හඳුන්වා දුන් පාසල් පුස්තකාල ප්‍රමිති ද සැකෙවින් දක්වා ඇත.

ඩබ්ලිව්.ඒ. වීරසූරිය (2007) මහතා පුස්තකාල හා විඥාපන විද්‍යා ලේඛන සමුච්චය සඟරාවේ පළකරන ලද **"විශ්ව දශම වර්ගීකරණයේ අපූර්වත්වය පිළිබඳ විමර්ශනයක්"** නම් ලිපියේ දී පුස්තකාල වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණ ඉතිහාසය, එහි සංස්කරණ සහ විශ්ව දශම වර්ගීකරණයේ අපූර්වත්ව ලක්ෂණ ද විග්‍රහ කර දක්වයි.

සූචිකරණයේ නව ප්‍රවණතා පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් නමින් පුස්තකාල හා විඥාපන විද්‍යා ලේඛන සමුච්චය සඟරාවේ ප්‍රියන්වදා වනිගසූරිය (2005) විසින් රචිත ලිපියේ සාකච්ඡා කෙරෙන්නේ සූචිකරණ නීති ඉතිහාසය, විකාශනය හා ඓතිහාසික සංවර්ධනය, AACR I, AACR II, ISBD සහ මාර්ග ගත සූචිකරණය පිළිබඳවයි.

ප්‍රනාන්දු (1987) විසින් පුස්තකාල ප්‍රවෘත්ති සඟරාවට ලියන ලද **"අන්තර්ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ක්‍රමය"** නම් ලිපියෙන් දැක්වෙන්නේ ග්‍රන්ථ සඳහා වන අන්තර්ජාතික

ප්‍රමිත අංක ක්‍රමය පිළිබඳවය. අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ අංකය (ISBN) විස්තර කිරීම, ඓතිහාසික පසුබිම, ISBN අංකය ලබා දෙන ආකාරය සහ ISBN ලබා දිය හැකි ග්‍රන්ථ හා ලබා දිය නොහැකි ප්‍රකාශන පිළිබඳ විග්‍රහයක් කර ඇත. අන්තර්ජාතික ප්‍රමිත ග්‍රන්ථ අංකයක් ලබා ගැනීමේ ක්‍රමය, ISBN ලේඛනයක් පවත්වාගෙන යාම සහ ISBN අංකය ග්‍රන්ථයක මුද්‍රණය කරන අයුරු ද පෙන්වා දී ඇත.

**දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති (Knowledge Organization Library Standards)**

පුස්තකාලවල භාවිත කරන දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති විශාල ප්‍රමාණයක් වර්තමානයේ දී හඳුනාගත හැකිය. වර්ගීකරණය, සූචිකරණය, අනුක්‍රමණිකාකරණය, විෂය ශීර්ෂ ලැයිස්තු, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ ප්‍රමිති, ග්‍රන්ථ සංසරණය, අක්ෂර පරිවර්තන ක්‍රම සහ සාධිකාරී ලේඛන වැනි තාක්ෂණික හා ප්‍රලේඛන සේවා ප්‍රමිති මෙහිදී සාකච්ඡා වේ.

**වර්ගීකරණ ප්‍රමිති (Standards of Classification)**

පුස්තකාල දැනුම සංවිධානයේ ප්‍රධාන මෙවලමක් වන පුස්තකාල වර්ගීකරණ ප්‍රමිති පිළිබඳ විමසා බැලීමේ දී වර්ගීකරණ ප්‍රමිති රාශියක් හඳුනාගත හැකිය. පුස්තකාල වර්ගීකරණය පුස්තකාලවල ආරම්භය දක්වා දිව යන්නකි. මුල්ම පුස්තකාලවල භාවිත කරන ලද පුස්තකාල ද්‍රව්‍ය සංවිධානය සඳහා විවිධ වර්ගීකරණ ක්‍රම භාවිත කර ඇත. " අසුරබනිපාල් රජුගේ මැටි පුවරු පුස්තකාලයේ" පවා යම්කිසි වර්ගීකරණ ක්‍රමයක් පවතින්නට ඇත. ඒ අනුව 'මැටි පුවරු, පාච්මන්ට්, වෙලම්, පැපිරස්, පුස්කොළ පොත්' වැනි පුස්තකාල ද්‍රව්‍ය මනා සංවිධානයක් සිදුකර ගැනීමට විවිධ වර්ගීකරණ ක්‍රම භාවිත කරන්නට ඇත. පුස්තකාල ද්‍රව්‍යවල වර්ණය, හැඩය, විශාලත්වය වැනි සාධක මත ද වර්ගීකරණ ප්‍රමිති සකස් කරන්නට ඇත. පසු කාලීනව විෂය සංවර්ධනයත් සමඟ කෘතියක ග්‍රන්ථ නාමය, ප්‍රකාශක, ප්‍රකාශිත වර්ෂය, යන විවිධ ක්ෂේත්‍ර මත පුස්තකාල ද්‍රව්‍ය වර්ගීකරණය කරන්නට ඇත.

වර්තමානය තෙක් භාවිත වන වර්ගීකරණ ප්‍රමිති සඳහා පාදක වූයේ එක් එක් දාර්ශනිකයන්ගේ ඥාන වර්ගීකරණයන් මතය. පුස්තකාල වර්ගීකරණ ප්‍රමිති පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකිය. ඥාන වර්ගීකරණය හෙවත් දැනුම වර්ගීකරණය පළමු වැන්නය. දෙවැන්න විෂය වර්ගීකරණයයි. ඥාන වර්ගීකරණයේ දී සිදු වන්නේ පවතින දැනුම අනුව පුස්තකාල ද්‍රව්‍ය වර්ග කිරීමයි. විෂය වර්ගීකරණයේ දී සිදු වන්නේ යම්කිසි විෂයන් සමූහයකට අනුව පුස්තකාල ද්‍රව්‍ය වර්ග කිරීමයි.

## ඥාන වර්ගීකරණ ප්‍රමිති / දැනුම වර්ගීකරණ ප්‍රමිති (Standards of Knowledge Classification)

ඥාන/දැනුම වර්ගීකරණ ක්‍රම අතීතයේ දී ලොව පුරා බිහිවුණි. මෙම ඥාන වර්ගීකරණ ක්‍රම අතීතයේ ලොව පුරා භාවිත වූ ඒවාය. මෙම වර්ගීකරණ ක්‍රම ඥාන/දැනුම වර්ගීකරණ ප්‍රමිති ලෙස හඳුන්වා දිය හැකිය. ඥාන/දැනුම වර්ගීකරණ ප්‍රමිති පිළිබඳ විමසා බැලීමේ දී වෛදික යුගය දක්වා දිව යයි. එතැන් සිට විවිධ වූ දැනුම වර්ගීකරණ ක්‍රම ලොව පුරා බිහි වී ඇති බව පෙනී යන කරුණකි.

අ. වෛදික වර්ගීකරණ ප්‍රමිතිය (වෛදික යුගය)

ආ. අසුර-බනි-පාල් පුස්තකාල වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.පූ. 850)

ඇ. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්ගේ වර්ගීකරණය හෙවත් ග්‍රීක වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.පූ.428-347)

ඈ. ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාල වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.පූ. 260-240)

ඉ. ස්කොලස්ටික් (scholastic) වර්ගීකරණ ප්‍රමිතිය

ඊ. බැකෝනියන් පුස්තකාල වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව. 1561-1626)

උ. කාන්ට්ස්ගේ වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව. 1724-1804)

ඌ. කැලිමකුස් වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.පූ. 340-210)

එ. සියොන් මොනස්ට්‍රිගේ වර්ගීකරණ ප්‍රමිතිය

ඒ. ගැන්සර් පුස්තකාල වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව. 1516-1565)

ඓ. බෲනට්ගේ වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව. 1780-1867)

ඔ. හොබ්ස්ගේ වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව.1585-1679)

ඕ. හේගල්ගේ වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව.1770-1831)

ඖ. කොම්තේගේ වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව.1798-1857)

ඍ. මර්ලින්ස්ගේ වර්ගීකරණ ප්‍රමිතිය (ක්‍රි.ව.1842)

මෙම සියලු පුස්තකාල වර්ගීකරණ ප්‍රමිති සකස් වී ඇත්තේ ඥානය හෙවත් දැනුම පදනම් කරගෙන බව 'ක්‍රිෂන් කුමාර්' (Krishan Kumar) රචනා කළ 'Theory of classification' කෘතියේ සහ 1977 දී 'ඒ. කේ. ඔඩියර්' (A.K. Ohdear) විසින් රචනා කරන ලද 'Library classification' නම් කෘතිය මගින් පෙන්වා දී තිබේ.

ක්‍රිෂන් කුමාර් සහ ඔඩියර්ට අනුව පුස්තකාල වර්ගීකරණ ප්‍රමිති විෂය අනුව ද නිර්මාණය වී ඇත. ඒ අනුව මෑත කාලීනව ලොව පුරා විවිධ රටවල ප්‍රචලිත පුස්තකාල ප්‍රමිති ලෙස පෙන්වා දී ඇත.

### විෂය වර්ගීකරණ ප්‍රමිති (Standards of Subject Classification)

අ. ඩිවි දශම වර්ගීකරණ ප්‍රමිතිය (DDC) - (ක්‍රි.ව. 1876)
ආ. ව්‍යාප්ත වර්ගීකරණ ප්‍රමිතිය (EC) - (ක්‍රි.ව. 1893)
ඇ. කොන්ග්‍රස් පුස්තකාල වර්ගීකරණ ප්‍රමිතිය (LCC) - (ක්‍රි.ව. 1897)
ඈ. විෂය වර්ගීකරණ ප්‍රමිතිය (SC) - (ක්‍රි.ව. 1897)
ඉ. විශ්ව දශම වර්ගීකරණ ප්‍රමිතිය (UDC) - (ක්‍රි.ව. 1905)
ඊ. දෙතිත් වර්ගීකරණ ප්‍රමිතිය (CC)-(ක්‍රි.ව. 1933)
උ. ග්‍රන්ථ විද්‍යාත්මක වර්ගීකරණ ප්‍රමිතිය (BC) - (ක්‍රි.ව. 1940)

මෙම වර්ගීකරණ ප්‍රමිති අතරින් ලොව පුරා බොහොමයක් පුස්තකාලවල භාවිත කරන පුස්තකාල වර්ගීකරණ ප්‍රමිතිය ලෙස ඩිවි දශම වර්ගීකරණ ප්‍රමිතිය හඳුන්වා දිය හැකිය.

### ඩිවි දශම වර්ගීකරණ ප්‍රමිතිය (Standard of Dewey Decimal Classification)

ඩිවි දශම වර්ගීකරණය හඳුන්වා දුන් පුරෝගාමියා වන්නේ 1857 දී ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයේ දී උපත ලද 'මෙල්විල් ලුවිස් කොසුත් ඩිවි' ය. ඔහු 1876 දී 'A Classification and subject index for cataloguing and arranging the books and pamphlets of a library' නමින් පිටු 44 ක කුඩා පොත් පිංචයක් ලෙස ප්‍රකාශයට පත් කළ මෙම වර්ගීකරණ ප්‍රමිතිය මේ වන විට එහි සංස්කරණ 23 ක් හඳුන්වා දී තිබේ. ඩිවි දශම වර්ගීකරණයේ දී පළ කරන ලද සංස්කරණවල දී 21 වන සංස්කරණ දක්වා චක්‍ර 7 ක් පැවති අතර ම 22 සහ 23 වන සංස්කරණවල දී එම චක්‍ර සංඛ්‍යාව චක්‍ර 6 දක්වා අඩුකර ඇත. කෙසේ වෙතත් 21 වන සංස්කරණයට අනුව ප්‍රධාන වශයෙන්ම වෙළුම් 4 ක් දක්වා ඇත.

1 වන වෙළුම - අත් පොත, චක්‍ර
2 වන වෙළුම - 0-599 දක්වා වර්ග පන්ති
3 වන වෙළුම - 600-999 දක්වා වර්ග පන්ති
4 වන වෙළුම - සාපේක්ෂ අනුක්‍රමණිකාව

ජොආන් එස්. මිචෙල්ගේ ප්‍රධානත්වයෙන් පළ කෙරුණු මෙම 21 වන සංස්කරණය තුළ ප්‍රධාන වශයෙන් චක්‍ර 7 ක් දක්නට ඇත. එම චක්‍ර 7 වන්නේ ,

1 වන චක්‍රය - ප්‍රමිත උප බෙදුම් (Standard Subdivisions)
2 වන චක්‍රය - භූගෝලීය චක්‍රය (Geographic Areas, Historical Periods, Biography)
3 වන චක්‍රය - සාහිත්‍ය චක්‍රය (Subdivisions for the Arts, for Individual Literatures, for Specific Literary Forms)
4 වන චක්‍රය - තනි භාෂා සහ භාෂා කුල සඳහා උප බෙදුම (Subdivisions of Individual Languages and Language Families)

5 වන චක්‍රය - ජාති, වාර්ගික, ජාතික කණ්ඩායම් (Racial, Ethnic and National Group)

6 වන චක්‍රය - භාෂා චක්‍රය (Languages)

7 වන චක්‍රය - පුද්ගල කණ්ඩායම් (Group of Persons)

එසේම ප්‍රධාන වර්ගීකරණය ප්‍රධාන විෂය ක්ෂේත්‍ර 10 කට බෙදා දක්වා ඇත. ප්‍රධාන සාරාංශයේ දී කොටස් 10 කටත්, දෙවන සාරාංශයේ දී උප බෙදුම් 100 කටත්, තෙවන සාරාංශයේ දී උප බෙදුම් 1000 කටත් බෙදා දක්වා ඇත. සෑම අංකයක් ම අංක 3 කින් සමන්විත වේ. ඉන් පසුව දශම තිතත්, දශම තිතෙන් පසු සෑම අංක 3 කට වරක් හිඩැසක් පැවතීම මෙම වර්ගීකරණ ප්‍රමිතියෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.

'බ්‍රිතාන්‍ය රජිණ' නම් කෘතියට සපයන වර්ග අංක ලියා දක්වන්නේ

**352.233 094 1**

ලෙසය. මෙලෙස ඕනෑම වර්ගයක පුස්තකාලයක භාවිතයට ගත හැකි ලෙස සකසා ඇති මෙම වර්ගීකරණයේ පළමු සාරාංශයට අනුව ප්‍රධාන වර්ග පන්ති 10 කි.

000 - පොදු වර්ගය
100 - දර්ශනය
200 - ආගම
300 - සමාජීය විද්‍යා
400 - භාෂාව
500 - විද්‍යාව
600 - තාක්ෂණය
700 - කලා
800 - සාහිත්‍ය
900 - භූගෝල විද්‍යාව, චරිතාපදාන හා ඉතිහාසය

1933 දී පළ වූ 20 වන සංස්කරණයත් සමඟ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ඩිවි දශම වර්ගීකරණ ප්‍රමිතිය භාවිත කිරීම සඳහා 'Electronic Dewey' නමින් සංගෘහිත තැටියක් ලෙස නිකුත් කර ඇත. 2003 දී පළ වූ 22 වන සංස්කරණයේ දී අන්තර්ජාලය ඔස්සේ මාර්ගගත (On-line) ආකාරයට ඩිවි දශම වර්ගීකරණය භාවිත කළ හැකි පරිදි 'Web Dewey' ආරම්භ කෙරිණි. මෙය 2003 ජූලි මාසයේ දී ජොආන් එස්. මිචෙල්ගේ සංස්කාරකත්වයෙන් ඉටු වූ ප්‍රධානම කර්තව්‍යයක් බව එම්. පී. සතිජා (M.P. Satia) ගේ 'The Theory and practice of the Dewey Decimal Classification' නම් කෘතිය පරිවර්තනය කළ මහාචාර්ය පියදාස රණසිංහයන් (2011) 'ඩිවි දශම වර්ගීකරණයේ න්‍යාය හා භාවිතය' නම් කෘතියේ පෙන්වා දී තිබේ.

## සුචිකරණ ප්‍රමිති (Standards of Cataloging)

පුස්තකාල සුචිකරණ නීති පිළිබඳ විමසා බැලීමේ දී 19 වන සියවසේ මැද භාගය දක්වා දිව යයි. තනි පුද්ගලයෙකුගේ උත්සහයක ප්‍රතිඵලයක් වශයෙන් 1841 දී ඇන්තනී පැනීසි පළමුවෙන් ම සුචිකරණ නීති සංග්‍රහයක් හඳුන්වා දී ඇත. එතැන් සිට විවිධ පුද්ගලයන් සුචිකරණ කටයුතු සඳහා ප්‍රමිති සකස් කිරීමට උත්සහ ගෙන ඇත.

- ඇන්තනී පැනීසිගේ සුචිකරණ නීති 91 (1841)
- චාල්ස් සී. ජිවෙට් ගේ සුචිකරණ නීති 33
- චාල්ස් ඒ. කටර්ගේ සුචිකරණ නීති සංග්‍රහය (1876)

මෙම නීති සංග්‍රහයන් 19 වන සියවසේ අග භාගය තෙක් පුස්තකාලවල සුචිකරණ කටයුතු සඳහා භාවිත වී ඇත. මෙම කාල වකවානුව තුළ දී මුද්‍රණ ක්ෂේත්‍රයේ සිදු වූ විශාල වර්ධනය නිසාම විවිධ වූ ලේඛන සහ ග්‍රන්ථ ලොව පුරා බිහි විය. එසේම තොරතුරු මාධ්‍ය බිහි වීමේ අගය ද වැඩි වන්නට විය. එම නිසාම ඉහත සුචිකරණ නීති සංග්‍රහයන් ප්‍රමාණවත් නොවීය. මේ හේතුව නිසාම ඇමරිකානු පුස්තකාල සංගමය 1877 දී විශේෂ කමිටුවක් පත්කර 1883 දී 'Library Journal' සඟරාවේ අටවැනි කලාපයේ ඕනෑම පුස්තකාලයක් සඳහා වන සුචිකරණ නීති සංග්‍රහයක් පළ කර ඇත.

1908 දී ඇමරිකානු පුස්තකාල සංගමය සහ බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමය එකට එක්ව "Cataloging Rules: Author and title entries" නමින් සුචිකරණ නීති සංග්‍රහයක් නිර්මාණය කර ඇත. වර්ෂ 1949 දී කොංග්‍රස් පුස්තකාලය විසින් "Library of Congress rules for descriptive cataloging in the Library of Congress" නමින් සුචිකරණ නීති සංග්‍රහයක් හඳුන්වා දී ඇත.

විවිධ පුද්ගලයන් සහ සංවිධාන සහ ආයතන පුස්තකාල සුචිකරණ කටයුතු සඳහා විවිධ වූ ප්‍රමිති හඳුන්වා දුන්න ද ඒවා ප්‍රමාණවත් නොවීය. මේ නිසාම ලොව පුරාම පොදුවේ භාවිත කළ හැකි සුචිකරණ ප්‍රමිතියක් නිර්මාණය කිරීමට අවශ්‍ය විය. විවිධ වූ තීන්දු තීරණ අනුව 1967 දී ඇංග්ලෝ - ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහය, I (AACR - I) ලොවට බිහි විය.

## ඇංග්ලෝ - ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහය I, 1967 (Anglo -American Cataloging Rules - I, 1967)

ලොව පුරා පවතින පුස්තකාලවල භාවිතය සඳහා සැකසුණු තරමක් දුරට හෝ සාර්ථක වූ සුචිකරණ නීති සංග්‍රහයක් හෙවත් සුචිකරණ ප්‍රමිතියක් ලෙස 'AACR - I' හඳුන්වාදිය හැකිය.

1908 දී සුවිකරණ ප්‍රමිතියක් සකස් කිරීමට බ්‍රිතාන්‍ය දැක්වූ උනන්දුව අනුව බ්‍රිතාන්‍ය සහ ඇමරිකා එක්සත් ජනපදය එක් වී 1953 දී ලුබෙට්ස්කිගේ මූලධර්ම සකසන්නට විය. ඒ අනුව 1960 දී ලුබෙට්ස්කිගේ නීති සංග්‍රහයත්, 1961 පැරිස් මූලධර්මයත් පදනම් කර ගනිමින් 1956 දී 'AACR - I' කටයුතු ඇරඹිණි. සේමර් ලුබෙට්ස්කි 1962 දී එහි සංස්කාරකත්වයෙන් ඉවත් වූ නිසාම ඒ සඳහා පත් වූයේ 'සී. සමස් ස්පෝල්ඩින්' ය.

මෙම නීති සංග්‍රහය සම්පාදනය කිරීම සඳහා ඇමරිකානු පුස්තකාල සංගමය, බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමය සහ කැනේඩියානු පුස්තකාල සංගමය එකට එක් වී ඇත. 'AACR - I' ව්‍යුහය ප්‍රධාන කොටස් තුනකින් සමන්විත ය.

- පළමු කොටස - සංලේඛය සහ ශීර්ෂය (Entry and Heading)

1. සංලේඛය - Entry
2. පුද්ගල නාම ශීර්ෂ - Headings for persons
3. ආයතන නාම ශීර්ෂ - Headings for co-operate bodies
4. ඒකීය ග්‍රන්ථ නාම -Uniform titles
5. අන්තර් නිර්දේශ - Reference

- දෙවන කොටස - ග්‍රන්ථ විස්තරය (Description) පරිච්ඡේද 4 කි.

6. වෙනම ප්‍රකාශිත ඓකික ග්‍රන්ථ සහ වෙනත් මාලික නොවන ප්‍රකාශන (Separately published monographs and other non-serial publications)
7. මාලික ප්‍රකාශන (Serials)
8. ආදී මුද්‍රිත ග්‍රන්ථ (Incunabula)
9. ඡායාරූපමය හා වෙනත් ප්‍රතිරූපණ (Photographic and other reproductions)

- තෙවන කොටස - පොත් නොවන ද්‍රව්‍ය (Non-book material) පරිච්ඡේද 5 කින් යුතුය.

10. අත් පිටපත්
11. සිතියම්, ත්‍රිමාන සිතියම්, ලෝක ගෝල හා සිතියම් පොත්
12. චලන චිත්‍රපට හා චිත්‍රපට තීරූ
13. සංගීතය
14. හඬ වාර්තා
15. පින්තූර, සැකසුම් හා වෙනත් ද්විමාන නිරූපණ

මීට අමතරව උප ග්‍රන්ථ 6 කින් ද සමන්විතය.

1. පදමාලාව - Glossary
2. කැපිටල් අකුරු භාවිතය - Capitalization

3. හැකුළුම් - Abbreviations
4. සංඛ්‍යා - Numbers
5. විරාම ලකුණු හා උච්චාරණ ලකුණු - Punctuation and diacritics
6. උතුරු ඇමරිකානු පෙළේ වෙනස් ව යෙදෙන සංලේඛ ශීර්ෂ පිළිබඳ නීති

මෙම නීති සංග්‍රහය තුළ ද විවිධ වූ දුර්වලතා පැවතිය ද 1967 වන තුරු බිහිව තිබූ විශිෂ්ටතමය ලෙස මහාචාර්ය පියදාස රණසිංහයන් පෙන්වා දී ඇත.

**ඇංග්ලෝ - ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහය -II, 1978 (Anglo - American Cataloging Rules - II, 1978)**

1967 දී බිහි වූ ඇංග්ලෝ - ඇමරිකානු නීති සංග්‍රහය තුළ පවතින දුර්වලතා විවිධ අවස්ථාවල දී විවේචනයට ලක් විය. පුස්තකාල කටයුතු යාන්ත්‍රීකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු වීම, නව මාධ්‍ය වැඩි වශයෙන් බිහි වීම, සුචිකරණ කටයුතු සඳහා පරිගණක භාවිතය ආරම්භ වීම, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ග්‍රන්ථ විඥාපන පාලන කටයුතු පෙර නොවූ විරූ අයුරින් සංවර්ධනය වීම, සුචිකරණය සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිති බිහිවීම වැනි තත්ත්වයන් නිසාම 'AACR-I' හි නව සංස්කරණයක අවශ්‍යතාව මතු වී පෙනුණි. 1967 නීති සංග්‍රහයේ 6 වැනි පරිච්ඡේදය නව ISBD ප්‍රමිතියට අනුව 1974 දී සංශෝධනය කර ඇත. 1978 දී පළ වූ AACR -2 සංස්කරණය 1967 දී පළ වූ එහි පූර්ව සංස්කරණයට වඩා ව්‍යුහාත්මක වශයෙන් බෙහෙවින්ම වෙනස්ය.

AACR -2 ප්‍රමිතිය මූලික වශයෙන්ම කොටස් දෙකකින් යුක්තය.

- පළමු කොටස - ග්‍රන්ථ විස්තරය මෙය පරිච්ඡේද 13 කින් සමන්විතය
  1. ග්‍රන්ථ විස්තරය පිළිබඳ පොදු නීති
  2. පොත්, පුස්තිකා හා මුද්‍රිත පත්‍රිකා
  3. සිතියම් ද්‍රව්‍ය
  4. අත් පිටපත්
  5. සංගීතය
  6. ශබ්ද වාර්තා
  7. චලන චිත්‍රපට හා වීඩියෝ වාර්තා
  8. ග්‍රැෆික් චිත්‍ර
  9. පරිගණක ගොනු
  10. ත්‍රිමාන ද්‍රව්‍ය හා නිදර්ශන
  11. සූක්ෂම ස්වරූප
  12. මාලික ප්‍රකාශන
  13. විශ්ලේෂණ

- දෙවන කොටස - ශීර්ෂ, ඒකීය ග්‍රන්ථ නාම හා හරස් යොමු

14 -20 දක්වා හිඩැසක් තබා ඇත. එය අනාගතයේ බිහිවිය හැකි පුස්තකාල ද්‍රව්‍යවලට ඉඩ සැලසීම සඳහා තබන ලද්දක් ලෙස පෙන්වා දී ඇත. මූලිකව ම මෙම කොටස පරිච්ඡේද 6 කි.

21. ප්‍රවේශන ස්ථාන තේරීම
22. පුද්ගල නාම ශීර්ෂ
23. භූගෝලීය නාම
24. ආයතන නාම ශීර්ෂ
25. ඒකීය ග්‍රන්ථ නාම
26. හරස් යොමු

මීට අමතරව උප ග්‍රන්ථ 4 කින් යුක්තය.

1. කැපිටල් අකුරු භාවිතය
2. හැකුළුම්
3. සංඛ්‍යා
4. පද මාලාව

මීට අමතරව අනුක්‍රමණිකාවකින් ද යුක්තය. මෙම ආකාරයට AACR -2 පළ කෙරුණු අතර කාලීනව සිදු වූ විවිධ වෙනස්වීම් මත AACR -2 හි විවිධ සංශෝධන සිදු විය. ඒ අනුව 'AACR2R 88' ලෙස පළමුව සංශෝධනය වී ඇත. අනතුරුව 'AACR2R 98' ලෙස ද AACR-2 සංශෝධනය වී ඇත. වර්ෂ 2002 දී ද නව සංශෝධනයක් එක් වී ඇති බව පෙන්වා දී තිබේ.

21 වන සියවස තුළ ඇති වී ඇති විශාල තාක්ෂණික විපර්යාසය නිසාම AACR-II තව දුරටත් ප්‍රමාණවත්දැයි තරමක් දුරට ගැටලු සහගත යැයි පෙන්වා දිය හැකිය. AACR -3 නව නීති සංග්‍රහයක අවශ්‍යතාව බෙහෙවින්ම පැන නැගී ඇත. කෙසේ වෙතත් වර්තමානය වන විට ලොව පුරා පුස්තකාලවල සූචිකරණ කටයුතු සඳහා විශාල වශයෙන් භාවිත කරන සූචිකරණ ප්‍රමිතිය ලෙස AACR-2 හඳුන්වා දිය හැකිය.

### යන්ත්‍ර පාඨ්‍ය සූචිකරණය (Machine Readable Cataloging - MARC)

පරිගණක භාවිතයෙන් ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත හැසිරවීම සඳහා MARC කේත පද්ධතිය භාවිත කරයි. ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත යන්ත්‍ර පාඨ්‍ය ස්වරූපයෙන් හුවමාරු කර ගැනීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතියක් ලෙස MARC හඳුන්වා දී ඇත්තේ මහාචාර්ය පියදාස රණසිංහයන්ය. 1963 'King Report' අනුව 1964 දී MARC හි ආරම්භය සිදු වූයේ කොංග්‍රස් පුස්තකාලයේ දී ය. 1965 දී Council on library Resources හි ආධාරය මත 1966 දී MARC-1 නියමු ව්‍යාපෘතිය ඇරඹුණු බව දක්වා ඇත. අත්හදා බලන වර්ෂයේ දී ප්‍රකාශන

50000 ක් MARC ආකෘතියට අනුව සුචිගත කර ඇත. MARC-1 ව්‍යාපාරය සාර්ථක වූ නිසා 1967 දී MARC-2 ව්‍යාපෘතිය අරඹා ඇත. බ්‍රිතාන්‍යයේ මෙම ව්‍යාපෘතිය අරඹා ඇත්තේ 1969 දී බව ද දක්වා ඇත. MARC-21 පද්ධතියේ දත්ත ආකාර හෙවත් ආකෘති 5 ක් දක්වා ඇත.

1. ග්‍රන්ථ විද්‍යාත්මක ආකෘතිය (Bibliographic Format)
2. සාධිකාරී ආකෘතිය (Authority Format )
3. සම්භාර ආකෘතිය (Holding Format)
4. ප්‍රජා විඥාපන ආකෘතිය (Community Information Format)
5. වර්ගීකරණ දත්ත වාර්තාව (Classification Data Format)

MARC-21 හි වාර්තාවක අන්තර්ගත සංඝටක ද දක්වා තිබේ.

1. ප්‍රමුඛ කොටස (Leader)
2. වාර්තා ඩිරෙක්ටරිය (Record Directory)
3. පාලන ක්ෂේත්‍රය අස්ථාවර ක්ෂේත්‍ර (Control fields)
4. විචල්‍ය ක්ෂේත්‍ර (Variable fields) යන ඒවා සංඝටක වේ.

සකසා ගත් MARC වාර්තා බෙදා හරිනු ලබනුයේ MARC (Communication Format) ස්වරූපයෙනි. එක් එක් වාර්තා දීර්ඝ අක්ෂර සමූහයකින් යුතු ප්‍රමුඛ කොටසකින් ද, වාර්තා ඩිරෙක්ටරියකින් ද, අනතුරුව එකිනෙකට පසුව යෙදෙන ක්ෂේත්‍ර ගණනාවක් වශයෙන් සැකසී ඇත.

MARC ප්‍රමිතිය වර්තමානය වන විට ලොව පුරා පරිගණක ආශ්‍රිත සුචිකරණ කටයුතු සඳහා භාවිත කරන ලොව ජනප්‍රියතම සහ විධිමත් වූ සුචිකරණ ප්‍රමිතියක් ලෙස පෙන්වා දිය හැකිය.

## අනුක්‍රමණිකා සඳහා වන ප්‍රමිති - (Standards of Indexing)

අනුක්‍රමණිකාකරණ ප්‍රමිති පිළිබඳ විමසා බැලීමේ දී ප්‍රධාන වශයෙන් කොටස් 2 කි.

අ. පූර්ව සමන්වය අනුක්‍රමණිකාකරණ ක්‍රමය
Pre-Co-ordinate Indexing Method

ආ. අපර සමන්වය අනුක්‍රමණිකාකරණය
Post-Co-ordinate Indexing Method

### අ. පූර්ව සමන්වය අනුක්‍රමණිකාකරණ ක්‍රමය (Pre-Co-ordinate Indexing Method)

මෙහි දී යම් විෂයක් ගවේශනය කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු සුචිකාරකයා / අනුක්‍රමණිකාකරු විසින් කල් තියා සංවිධානය කරනු ලැබේ. යම් කිසි ලේඛනයක් හෝ කෘතියක් අනුක්‍රමණිකාගත කිරීමේ දී එහි අන්තර්ගත විෂය සංකල්ප හෙවත් පද, එම කෘතියෙහි සමස්ත විෂය පරාසය වඩාත් හොඳින් නිරූපනය කිරීමට හැකි වන පරිදි නිශ්චිත වූත්, ස්ථාවර වූත් අනුක්‍රමයකට සම්බන්ධ කර විෂය ශීර්ෂ ගොඩනැංවීම මෙහි දී සිදුවේ.

මෙම ක්‍රමය තුළ දැකිය හැකි අනුක්‍රමණිකාකරණ ක්‍රම 3 කි.

I. දාම අනුක්‍රමණිකාකරණය
(Chain indexing)

II. පරිරක්ෂිත සන්දර්භ අනුක්‍රමණිකාකරණය
(PRECIS indexing)

III. බීජ පද අනුක්‍රමණිකාකරණය
(Key Words indexing)

**I. දාම අනුක්‍රමණිකාකරණය (Chain Indexing)**

එස්. ආර්. රංගනාදන් විසින් හඳුන්වා දුන් මෙය වර්තමාන පුස්තකාලවල භාවිත කරන එක් අනුක්‍රමණිකාකරණ ප්‍රමිතියකි. ප්‍රලේඛනයක විෂය පෙන්නුම් කිරීමට යොදන වර්ග අංකය ගෙන එම වර්ග අංකයේ පියවරෙන් පියවරට අදාළ වර්ගීකරණයේ තිබෙන ස්වාභාවික භාෂාවෙන් විෂය ශීර්ෂ ලබා ගනී. පසුව වඩාත් උචිත විෂය ශීර්ෂ සාදා ගනී.

උදාහරණ ලෙස (Advertising) "ප්‍රචාරණය" යන වචනය ගතහොත් (Dewey Decimal Classification) ඩිවි දශම වර්ගීකරණයට අනුව එහි වර්ග අංකය වන්නේ 659.1 ය. එම වර්ග අංකයට අදාල විෂය පරම්පරාව පළමුව සකසා ගනී.

600 - තාක්ෂණය (Technology)
650 - ව්‍යාපාර හා ක්‍රමවේද (Business & methods)
659 - වෙනත් ව්‍යාපාරික මාතෘකා (Other business Topic)
659.1 - ප්‍රචාරණය (Advertising)

පසුව මෙම විෂය පරම්පරාවෙහි වඩාත් අත්‍යවශ්‍යම සහ පාඨකයන් වැඩි වශයෙන්ම සොයන විෂයන් තෝරා මෙම අනුක්‍රමණිකාවන් සකසා ගැනේ.

**II. පරිරක්ෂිත සන්දර්භ අනුක්‍රමණිකාකරණය (Preserved Context Indexing System)**

1971 දී ඩෙරෙක් ඔස්ටින් විසින් හඳුන්වා දුන් අනුක්‍රමණිකාකරණ ක්‍රමයකි. යම් ප්‍රලේඛනයක අන්තර්ගත විෂය පළමුව වෙන වෙනම සංකල්ප වලට බෙදා අනතුරුව ප්‍රලේඛනයේ සාරාංශ වශයෙන් දක්වෙන පරිදි එකී සංකල්ප තර්කානුකූලව සහ අර්ථාන්විත ව අනුක්‍රමයකට සකසනු ලබන පද දාමය ඔස්සේ සංලේඛ සකසා ගැනීම මෙහිදී සිදු වේ. පදය (Term), පද දාමය (String), කාර්ය සම්බන්ධක සංකේත (Role operations) යන සංකල්ප අනුව මෙම අනුක්‍රමණිකා ක්‍රමය සකස් වී ඇත. එසේම "සන්ධර්භ රැඳියාව සහ එකට එක සබඳතාවය" පද සැදීමේ මූලධර්ම ලෙස භාවිත කරයි. උදාහරණ ලෙස "Bibliography of banking in Malaysia"යන ප්‍රලේඛනය "PRECIS" ප්‍රමිතියට අනුව සකස් කරනුයේ පහත පරිදිය.

Bibliography. Banking. Malaysia ලෙස සකසා ගැනේ.

### III. බීජ පද අනුක්‍රමණිකාව - Key Words Indexing

ප්‍රලේඛනයක නාමය, එම ප්‍රලේඛනයේ විෂය අන්තර්ගතය නිරූපණය කරන සාරාංශයක් හෙවත් ප්‍රලේඛන මාතෘකාවේ ප්‍රමුඛ පද ඇසුරෙන් විෂය හඳුනා ගන්නා ක්‍රමවේදයක් ලෙස මහාචාර්ය පියදාස රණසිංහයන් (2007) විෂය සුචිකරණය හා අනුක්‍රමණිකාකරණය නම් කෘතියේ දී පෙන්වා දී තිබේ. 1856 දී ඇන්ඩ්‍රියා ක්‍රෙස්ටඩෝරෝ (Andrea Crestadoro) විසින් හඳුන්වා දුන් අතර 1958 දී IBM සමාගමේ හැන්ස් පී. ලූන් (Hans P. Luhn) විසින් යළි පණ ගන්වන ලදි. ප්‍රමුඛ පද අනුක්‍රමණිකා ක්‍රම 4 කි.

- **සන්දර්භය තුළ බීජ පද අනුක්‍රමණිකාකරණය (Key Word In Context - KWIC)**

මෙහි මූලික පියවර 3කි.

අ. ග්‍රන්ථ නාමයෙන් ප්‍රමුඛ පද තෝරා ගැනීම

ආ. සංලේඛ සම්පාදනය

ඇ. සංලේඛ ගොනු කිරීම

මෙහිදී එක් එක් ප්‍රමුඛ පදය සමඟ සමස්ත ග්‍රන්ථ නාමයේ සන්ධර්භය දක්වනු ලබයි. උදාහරණ ලෙස “History of Education in Sri Lanka” යන්න KWIC අනුව සකසන්නේ

| | |
|---|---|
| Education In Sri Lanka / History of | 1127 |
| History of Education in Sri Lanka | 1127 |
| Sri Lanka / History of Education in | 1127 යන ආකාරයටය. |

- **සන්දර්භයෙන් බැහැර බීජ පද අනුක්‍රමණිකාකරණය (Key Word Out of Context - KWOC)**

මුලින්ම ප්‍රමුඛ පද තෝරා ගනී. පසුව ප්‍රමුඛ පදය පේළියේ වම් පස ස්ථානගත කර අනතුරුව සමස්ත ග්‍රන්ථ නාමයත් දකුණු කෙළවරෙහි ප්‍රලේඛනයේ කේතය දක්වනු ලබයි. උදාහරණ ලෙස “Training and education of public librarians” යන ප්‍රලේඛනය KWOC ආකාරයට සකසා ගන්නේ

| | | |
|---|---|---|
| **Education** | Training and Education of Public Librarians | 663 |
| **Librarians** | Training and Education of Public Librarians | 663 |
| **Public** | Training and Education of Public Librarians | 663 |
| **Training** | Training and Education of Public Librarians | 663 |

ලෙසය. මීට අමතරව තවත් ප්‍රමුඛ පද අනුක්‍රමණිකා ක්‍රම 2ක් හඳුනා ගත හැකිය.

- **පෝෂිත සන්දර්භ ප්‍රමුඛ පද අනුක්‍රමණිකාකරණය (Key Word Augmented in Context - KWAC)**
- **සන්දර්භය සමඟ ප්‍රමුඛ පද අනුක්‍රමණිකාකරණය (Key Word With Context - KWWC)**

**ආ. අපර සමන්වය අනුක්‍රමණිකාකරණය (Post-co-ordinate indexing method)**

මෙහි දී උපයෝජකයා විසින් ගවේෂණ අවස්ථාවේ දී තමන්ට කැමති පරිදි පද ගළපා අවශ්‍ය ලේඛනය සොයා ගැනීම සඳහා මෙම අනුක්‍රමණිකා ක්‍රමය යොදා ගැනේ. මෙය ද කොටස් 2 කට බෙදා දක්වා ඇත.

- අයිතම සංලේඛ ක්‍රමය (Item Entry System)
- පද සංලේඛ ක්‍රමය (Term Entry System)

අයිතම සංලේඛ ක්‍රමයේ දී එක් ප්‍රලේඛනයක් සඳහා එක් පත්‍රිකාවක් භාවිත කරයි. ප්‍රලේඛනයේ අන්තර්ගත එක් එක් විෂය සංකල්පය පත්‍රිකා දාරය දිගේ සිදුරු කැපීමෙන් කේතවලින් නිරූපණය කරයි. මෙම ක්‍රමය සඳහා උදාහරණ ලෙස දක්වා ඇත්තේ " අගවිධිපත් කාඩ්පත්" අනුක්‍රමණිකා ක්‍රමයයි.

පද සංලේඛ ක්‍රමයේ දී පද ඇතුළත් පත්‍රිකාවලට ප්‍රලේඛන අංක ස්ථාන ගත කර සකසා ගනී. පද සංලේඛ ක්‍රම වශයෙන්

- ඒක පද අනුක්‍රමණිකාකරණය (Uniterm)
- දෘෂ්ටික සන්නිපතන ක්‍රමය (Optical coincidence )

යන අනුක්‍රමණිකා ප්‍රමිතීන් පෙන්වා දී ඇත.

## විෂය ශීර්ෂ ලැයිස්තු (Subject Headings Lists)

ප්‍රකාශනයන්හි විෂය වර්ගීකරණය සඳහා භාවිත කරන වර්ගීකරණ ක්‍රම මඟින් වර්ග අංක මෙන්ම විෂය ශීර්ෂ භාවිත කිරීම ද සිදුවේ. උපයෝජකයන්ට සුචි සංලේඛවල ඇතුළත් විෂයන් වෙත පිවිසීම සඳහා භාවිත කළ යුතු සාධිකාරී පද මාලාවක් හෙවත් ශීර්ෂ සමූහයක් ඉදිරිපත් කිරීම විෂය ශීර්ෂ ලැයිස්තු මඟින් සිදු වේ. විෂය ශීර්ෂ ලැයිස්තු පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ලොව පුරා බහුලවම භාවිත කරන විෂය ශීර්ෂ ලැයිස්තු 2ක් හඳුනා ගත හැකිය.

**කොංග්‍රස් පුස්තකාලයීය විෂය ශීර්ෂ ලැයිස්තුව (Library of Congress Subject Headings - LCSH)**

ඇමරිකා එක්සත් ජනපද කොංග්‍රස් පුස්තකාලයේ සුචිකරණ වාර්තා සඳහා භාවිත කිරීම පිණිස සංවර්ධනය කළ විෂය ශීර්ෂ ලැයිස්තුවකි. 1914 දී මෙය හඳුන්වා දී ඇති අතර මින් පසු ලොව පුරා පුස්තකාලවල ව්‍යාප්ත වී ඇත.

කොංග්‍රස් පුස්තකාලයීය විෂය ශීර්ෂ ලැයිස්තුව තුළ ඇති සියලුම විෂය ශීර්ෂ කොංග්‍රස් පුස්තකාලය විසින් භාවිත කරනු ලබන සාධිකාරී විෂය නාම වන බැවින් මෙය සාධිකාරී විෂය නාම ලැයිස්තුවක් ලෙස පෙන්වා දී ඇත. මුද්‍රිත, සංගෘහිත තැටි සහ මාර්ග ගත ආකාරයට විෂය ශීර්ෂ ලැයිස්තුව ප්‍රකාශයට පත් කර ඇත.

මුද්‍රිත ලැයිස්තුවේ සාධිකාරී ශීර්ෂ දක්වෙන්නේ තද කළු අකුරෙනි. කළු නොකරන ලද අකුරින් මුද්‍රිත ශීර්ෂ සාධිකාරී විෂය ශීර්ෂ නොවේ. ඒවා කලින් සඳහන් කරන පරිදි සාධිකාරී විෂය ශීර්ෂ වෙත උපයෝජකයා යොමු කරන මඟ පෙන්වීමේ ශීර්ෂයන්ය. මෙබඳු ශීර්ෂවලට පෙර UF,BT,SA,NT යන සංකේත අදාල පරිදි යොදා ඇත.

UF - (Use For - සඳහා භාවිත වේ)

BT - (Broader Topic -පුළුල් මාතෘකාව)

RT - (Related Topic -සම්බන්ධිත මාතෘකාව)

SA - (See Also - ද බලන්න)

NT - (Narrower Topic -පටු මාතෘකාව)

**Berries** යන උදාහරණය විමසා බැලීමේ දී පහත අයුරින් දක්වා ඇත.

**Berries**

BT - Fruit

RT - Cookery Berries

SA - Straw berries

NT - Blue berries

Caned berries

Frozen berries

විෂය ශීර්ෂ ඒවායින් ඉටු කරන කාර්ය භාරය අනුව වර්ග 3 කට බෙදා ඇත.

I. මාතෘකාමය ශීර්ෂ -Topical headings
II. රූපණ ශීර්ෂ - Form headings
III. නාමික වස්තු සඳහා වන ශීර්ෂ - Headings for named entries

මෙම විෂය ශීර්ෂ ලැයිස්තුව සාධිකාරී විෂය ශීර්ෂ ලැයිස්තුවක් වන නිසාම ලොව පුරා පුස්තකාලවල පුස්තකාල කටයුතු සඳහා භාවිත කරන විෂය ශීර්ෂ ලැයිස්තුවක් ලෙස පෙන්වා දිය හැකිය.

**සියර්ස් විෂය ශීර්ෂ ලැයිස්තුව (Sears List of Subject Headings - SLSH)**

කුඩා සහ මධ්‍යම ප්‍රමාණ පුස්තකාලවල භාවිතය සඳහා සුදුසු විෂය ශීර්ෂ ලැයිස්තුවක් ලෙස සියර්ස් විෂය ශීර්ෂ ලැයිස්තුව හඳුන්වා දිය හැකිය. 1923 දී "මිනි අර්ල් සියර්ස්" විසින් හඳුන්වා දී ඇත. 1986 දී මෙහි 13 වන සංස්කරණය සිදු කර ඇති අතර 2004 දී ජෝශප් මිලර්ගේ ප්‍රධානත්වයෙන් මෙහි 18 වන සංස්කරණය එළි දක්වා ඇති බව ද සඳහන් කර ඇත.

මේ අනුව පර්යාය පද කෝෂ ක්‍රමයේ දී භාවිත NT, BT, RT, USE සහ SA යන හැකුළුම් පද භාවිත කර ඇත. මෙය කොංග්‍රස් පුස්තකාලයීය විෂය ශීර්ෂ ලැයිස්තුවට වඩා සරල වූවක් ලෙස පෙන්වා දී ඇත. සියර්ස් ලැයිස්තුවේ ප්‍රධාන මූලධර්ම 3 කි.

I. ඍජු හා නියත සංලේඛ
II. පොදු භාවිතය
III. ඒකීයත්වය

සියර්ස් හි ව්‍යුහය පිළිබඳ විමසා බැලීමේ දී එය අකාරාදී විෂය නාම ලැයිස්තුවකි. මූලික කොටස් 2 ක් දක්වා ඇත.

I. පොදු බෙදුම් ලැයිස්තුවක් ඇතුළත් හැඳින්වීමේ කොටස
II. සෑම පිටුවකටම තීරු 2 ක් යටතේ දක්වා ඇති අකාරාදී විෂය නාම ලැයිස්තුව

මෙහි දෙවන කොටසේ ඇතුළත් විෂය ශීර්ෂ ලැයිස්තුව වර්ග 2 කට යොදා ඇති අතර ඒවා වන්නේ අනභිමත ශීර්ෂ (Preferred headings) ලෙසය. අනභිමත ශීර්ෂ සියල්ලකම USE යන උපදේශයන් සමග අභිමත ශීර්ෂ වෙත යොමු කිරීමක් සිදු කරයි.

Dairy Farming

**USE** Dairing

අභිමත ශීර්ෂ, භාවිතයට ගතයුතු ශීර්ෂ, වන අතර අභිමත ශීර්ෂ වර්ග 4 කි.

I. මාතෘකාමය ශීර්ෂ
II. රූපණ ශීර්ෂ
III. භූගෝලීය ශීර්ෂ
IV. නම් (පුද්ගල. ආයතන ආදී)

මෙම විෂය ශීර්ෂ ලැයිස්තුව ද ලොව පුරා පුස්තකාලවල තම පුස්තකාල කටයුතු කරගෙන යාම සඳහා භාවිතයට වැදගත් විෂය ශීර්ෂ ලැයිස්තු ප්‍රමිතියක් බව පෙන්වාදිය හැකිය.

## ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ ප්‍රමිති (Standards for Bibliographic Information)

කිසියම් ජාත්‍යන්තර මට්ටමකින් යම් ප්‍රමිතියකට අනුව ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර ඉදිරිපත් කිරීම 1950 දශකයෙන් පසුව සිදු වී ඇති බව දක්වා අත. සුචිකරණ ක්‍රියාවලියේ මූලික අංගයක් ලෙස සුචිගත කරනු ලබන කෘති පිළිබඳ විස්තර දැක්වීම හඳුන්වා දී තිබේ.

විශ්ව ග්‍රන්ථ විඥාපන පාලනයක් ඇති කිරීම සම්බන්ධ යුනෙස්කෝ ආයතනයත් (UNESCO), පසුව ඉෆ්ලා (IFLA) ආයතනයත් මැදිහත්ව පළමුවෙන්ම ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සඳහා ප්‍රමිතීන් සකස් කර ඇත.

**ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය (ඒකික ග්‍රන්ථ)- (International Standards Bibliographic Description Monograph - ISBD(M))**

ප්‍රථමයෙන්ම සම්මත කර ගන්නා ලද ප්‍රමිතිය වන අතර මෙය 1974 දී ප්‍රකාශයට පත් කර ඇත.

**ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය (මාලික ප්‍රකාශන)- (International Standards Bibliographic Description for Serials - ISBD(S))**

මාලික ප්‍රකාශන පිළිබඳව ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය සඳහා වූ මෙම ප්‍රමිතිය 1977 දී පළ කරන ලදි. ඇංග්ලෝ - ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහය සඳහා මෙය එක්කර ගත් අතර 1974 - 1977 දක්වා කාලය තුළ නිශ්චිතව සම්මත වූයේ ISBD(M) හා ISBD(S) පමණි. මෙය පුස්තකාල ද්‍රව්‍ය සියල්ලම නියෝජනය නොවන නිසාම නව සංස්කරණයක් වෙත යාමට අවශ්‍ය විය.

**ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය (පොදු)- (International Standards Bibliographic Description General - ISBD(G))**

පුස්තකාල ද්‍රව්‍ය සියල්ල සඳහාම පොදුවේ භාවිත කිරීමේ අවශ්‍යතාවය සපුරාලනු පිණිස 1977 දී මෙය ප්‍රකාශයට පත් වී ඇත. ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය මූලික ක්ෂේත්‍ර 08 කින් යුතු වේ.

i. ග්‍රන්ථ නාමය හා වගකීම් ප්‍රකාශය පිළබඳ ක්ෂේත්‍රය
ii. සංස්කරණ ක්ෂේත්‍රය
iii. ද්‍රව්‍ය (හෝ ප්‍රකාශන වර්ගය) පිළිබඳ විශේෂිත විස්තර ක්ෂේත්‍රය
iv. ප්‍රකාශනය, බෙදා හැරීම ආදිය පිළිබඳ ක්ෂේත්‍රය
v. භෞතික විස්තර ක්ෂේත්‍රය
vi. ග්‍රන්ථ මාලා ක්ෂේත්‍රය
vii. සටහන් ක්ෂේත්‍රය
viii. ප්‍රමිත අංකය හා ලබා ගැනීමේ කොන්දේසි පිළිබඳ ක්ෂේත්‍රය

වසර 35 කට ආසන්න කාලයක් පැරණි වන මෙම ISBD ප්‍රමිති වර්තමාන පුස්තකාලවල භාවිතයට ගැනීම විශාල ලෙස ගැටලුවකට ලක්වෙමින් පවතී. ISBD ප්‍රමාණවත් නොවීමත්, විවිධ තොරතුරු මාධ්‍යන්ගෙන් බිහි වීමත්, තොරතුරු සඳහා පිවිසිය හැකි නවීන දියුණු ක්‍රම තිබීමත් නිසාම වර්තමානය වන විට ISBD ඉක්මවා නවීන ක්‍රමෝපායන් සහිත ප්‍රමිතීන් වෙත යොමු වී ඇති බව දක්නට ලැබෙන ප්‍රධානතම කරුණකි.

**ඩබ්ලින් කෝ(ර්) ප්‍රමිතිය (Dubline Core)**

1995 දී සම්පාදනය වූ මෙම ප්‍රමිතිය මඟින් විවිධ මූලාශ්‍ර වල තොරතුරු විවිධ අයුරින් Meta data ආකාරයට එකතු කර ගැනීමේ හැකියාව ඇත. පරිගණක ගත සුචියකට හෝ පත්‍රිකා සුචියකට, තොරතුරු පද්ධති සංවර්ධනය කරන ඕනෑම පද්ධතියක් සඳහා මෙම ප්‍රමිතිය භාවිත කළ හැකි බව දක්වා ඇත.

මෙම Dubline Core ප්‍රමිතිය බොහෝ දුරට ISBD ප්‍රමිතිය ඉක්මවා යාමක් ලෙස ද හඳුන්වා දිය හැකිය.

මෙහි ප්‍රධාන වශයෙන්ම ක්ෂේත්‍ර 15 ක් හඳුනා ගත හැකිය.

1. නාමය (Title)
2. උත්පාදකයා (Creator)
3. විෂය (Subject)
4. විස්තරය (Description)
5. ප්‍රකාශකයා (Publisher)
6. සැපයුම්කරුවා (Contributor)
7. දිනය (Date)
8. මූලාශ්‍ර වර්ගය (Resource type)
9. ආකෘතිය (Format)
10. මූලාශ්‍ර අනන්‍යතාවය (Identifier)

11. මූලාශ්‍රය (Source)
12. භාෂාව (Language)
13. වෙනත් මූලාශ්‍ර සමඟ ඇති සබඳතාවය (Relation)
14. ආවරණ පථය (Coverage)
15. හිමිකම (Rights)

## Text Encoding Initiative - TEI

මෙම TEI ප්‍රමිතිය 1994 දී සම්පාදනය වූවකි. සමාජීය විද්‍යා ක්ෂේත්‍රය සහ මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රය සඳහා වඩාත් ගැළපෙන පරිදි මෙය ගොඩ නංවා ඇත. මෙය සංඛ්‍යාත පුස්තකාල (Digital Libraries) 100 ක් සඳහා යොදාගත් ප්‍රමිතියකි. මෙම ව්‍යාපෘතිය "TEI Lite" ලෙස නම් කර ඇත. මාටින් ඩිලන්ගේ (Martin Dillon's) "Assessing information on the internet" නම් කෘතියෙහි ග්‍රන්ථ විද්‍යාත්මක විස්තරය දක්වා ඇත්තේ

<teiHeader>
<fileDesc>
<titleStmt>
<title>Assessing information on the internet</title>
<author>Martin Dillon</author>
<titleStmt>
<editionStmt>NA</editionStmt>
<extent>NA</extent>

ආදී වශයෙනි.

මීට අමතරව විවිධ වූ ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර සඳහා වන ප්‍රමිති ලොවට හඳුන්වා දී ඇත.

- Organization from the Instruction Management System Project (IMS & IEEE LOM)
  මෙහි ක්ෂේත්‍ර 77 ක් ඇතුළත්ය.
- Government Information Locator Service (GILS)
  බ්‍රිතාන්‍ය ලිපි ලේඛන සඳහා යොදා ගත්තකි. ක්ෂේත්‍ර 88 ක් ඇත.
- Context Standard for Digital Geospatial (CSDGM)
  මෙම ප්‍රමිතිය ක්ෂේත්‍ර 340 ක් නියෝජනය කරයි.
- Online Information Exchange (ONIX)
  2000 දී සම්පාදනය වූ යුරෝපීය ව්‍යාපෘතියකි.
- Mete data Object Description Schema (MODS)

මෙය MARC යටතේ සංවර්ධනය කළේ කොංග්‍රස් පුස්තකාලයයි.

- Meta data Encoding and Transmission Standard (METS)
  මෙය ද කොංග්‍රස් පුස්තකාලය සම්පාදනය කර ඇත.
- Computer Interchange of Museum Information (CIMI)

මීට අමතරව විවිධ වූ පරිගණක භාෂා එක් කර ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමට නව ක්‍රම බිහි කරමින් පවතින බව දක්වා ඇත. World Wide Web (WWW) සඳහාම නිපද වූ Hypertext mark-up language - HTML හා Extensible Mark-up Language - HTML හා Extensible Mark-up Language - XML භාෂාවන් ලෙස හඳුන්වා දිය හැක. මෙම භාෂා ඔස්සේ පුස්තකාලවල තිබෙන තොරතුරු WWW හරහා මාර්ග ගත ක්‍රමයකට ලබා ගන්නා ක්‍රම අලුතින් නිපද විය. ඒ අනුව Dubline Core සමග Hyper Text Mark-up Language එක්ව නවතම ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ ප්‍රමිතියක් සකසා ගත හැකි බව දක්වා ඇත.

උදාහරණ ලෙස පහත විස්තරය දැක්විය හැක.

```
<link rel = “schema.DC” href= “http://purl..org/DC/elements/1.0/”>
<meta name = “DC.Title” content = “A Dirge”>
<meta name = “DC.Creator” content = “Shelly, percy Bysshe”>
<meta name = “DC.Type” content = “poem”>
<meta name = “DC.Date” content = “1820”>
<meta name = “DC.Format” content = “text/html”>
<meta name = “DC.Language” content = “en”>
```

මෙලෙස Dubline Coreසමග XML එකතු වීමෙන් ද නව ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිතියක් බිහි වී ඇත.

MARC ප්‍රමිතිය සමග XML එකතු වීමෙන් නව ග්‍රන්ථ විද්‍යාත්මක ප්‍රමිතියක් නිර්මාණය වී ඇත.

“700 10 $aRutherston, Albert Daniel, $d1881-1953” නම් MARC රෙකෝඩය MARC-XML ප්‍රමිතියට අනුව දක්වා ඇත්තේ

```
<data-fieldtag = “700” ind1= “1” ind2= “0”>
<subfield code = “a”>Rutherston, Albert Daniel, </subfield>
<subfield code = “d”>1881-1953</subfield>
</data-field>
```

ආකාරයටය.

මෙලෙස වර්තමානය වන විට ලොව පුරාම වඩාත් පහසු සහ සරල අයුරින් ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමටත් ඒවා ඇතුළත් කිරීමටත් හැකිවන අයුරින් සකසා ඇත. නවීන ලොව පුරා බිහිවන සංඛිත පුස්තකාලවල තිබෙන සංඛිත ද්‍රව්‍යයන් හි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සඳහා වන නවීන වූත් ප්‍රමිති සකස් වෙමින් පවතින බව පෙන්වා දිය හැකි කරුණකි.

## ග්‍රන්ථ සංසරණය සඳහා වන ප්‍රමිති (Standards of Circulation)

### ලෙජර් ග්‍රන්ථ සංසරණ ප්‍රමිතිය

ග්‍රන්ථ සංසරණ ක්‍රමයන්හී දී ලෙජර් ක්‍රමය යනු කුඩා පරිමාණයේ පුස්තකාල සඳහා භාවිතයට ගත හැකි ප්‍රමිතියක් බව ධනපාල ගුණසේකර (1998) රචනා කළ "පුස්තකාල සේවාවේ මූලිකාංග" නම් කෘතියෙහි දක්වා ඇත. සරල වූත් ඍජු වූත් ග්‍රන්ථ සංසරණ ක්‍රමයක් බවත් පෙන්වා දී තිබේ.

මෙම ප්‍රමිතියේ දී සිදු වන්නේ ලෙජරයක ස්වරූපයෙන් තිබෙන ලේඛනයක පාඨකයින්ට ග්‍රන්ථ නිකුත් කිරීම පිළිබඳ වාර්තා පවත්වාගෙන යාමටය. පුස්තකාලයේ ලියාපදිංචි සියලුම පාඨකයන් සඳහා වෙන වෙනම පිටු කීපයක් වෙන් කර තබයි. වෙන් කරන ලද පිටුවල පාඨකයින් විසින් බැහැර ගෙන යනු ලබන සහ ආපසු භාර දෙනු ලබන ග්‍රන්ථ පිළිබඳ වාර්තා සටහන් කරනු ලබයි. පාඨකයා පුස්තකාලයෙන් පොතක් බැහැරගෙන යන විට එහි විස්තරය මෙම ලේඛනයෙහි ඇතුළත් කර පුස්තකාල නිළධාරියෙකු අත්සන් කරයි.

මෙම ග්‍රන්ථ සංසරණ ක්‍රමය කුඩා පරිමාණ පුස්තකාල සඳහා භාවිතයට ගත හැකි සරලම ප්‍රමිතියක් ලෙස තවදුරටත් පැහැදිලි කර ඇත.

### බ්‍රවුන් ග්‍රන්ථ සංසරණ ප්‍රමිතිය

කාර්ය බහුල පුස්තකාලවලට කඩිනමින් තම ග්‍රන්ථ සංසරණ කටයුතු ඉටු කිරීමට අවශ්‍ය සරල සහ නිරවුල් පුස්තකාල ග්‍රන්ථ සංසරණ ප්‍රමිතියක් බව ධනපාල ගුණසේකර (1998) පෙන්වා දෙයි. ශ්‍රම පාදක (Manual) ග්‍රන්ථ සංසරණ ක්‍රමවලින් වැඩි වශයෙන්ම භාවිතයේ පවතින ක්‍රමය වශයෙන් ද ප්‍රකාශ කරයි.

මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මූලිකාංග කිහිපයකි.

- පොත් පසුම්බිය
- පොත් තුණ්ඩුව
- පාඨක බලපත්‍රය
- දින ලේබලය

ඉහත මූලිකාංග සපුරා ගැනීමෙන් පසුව බ්‍රවුන් ක්‍රමය භාවිත කළ හැකිවේ. ඒ අනුව බ්‍රවුන් ග්‍රන්ථ සංසරණ ක්‍රමයේ දී පළමුව සිදුවන්නේ පාඨකයන්ට අවශ්‍ය පාඨක බලපත්‍ර සකසා දීමයි. පසුව පාඨකයා තෝරා ගත් පොත් සිය පාඨක බලපත්‍ර ද සමඟ පුස්තකාල

කවුන්ටරයට ඉදිරිපත් කළ විට පුස්තකාල නිලධාරියා විසින් පොත විවෘත කර, පොතේ පසුම්බියෙහි බහා තිබෙන පොත් තුණ්ඩුව ඉවතට ගෙන පාඨක බලපත්‍රය තුළ බහාළයි. පාඨකයාට පොත් නිකුත් කළ බව මෙසේ සටහන් වාර්තා කිරීමෙන් අනතුරුව පාඨකයා විසින් පොත ආපසු භාරදිය යුතු දිනය පොතේ දින ලේබලය සටහන් කරයි. පසුව පාඨකයාට එම පොත ලබා ගත හැකිය.

පොත් තුණ්ඩුව බහාලන ලද පාඨක බලපත්‍රය, පොත ආපසු ලැබීමට නියමිත දිනය යටතේ සංසරණ ගොනුවේ බහාලන අතර එම පත්‍රිකා සිරස් අතට බහාලනු ලබයි. එම පාඨක බලපත්‍ර පෙළ ගස්වනු ලබනුයේ පොතේ ප්‍රතිග්‍රහණ අංකය යටතේ වීම විශේෂතාවයකි.

පොත නැවත භාර දීමේ දී පොතේ දින ලේබලයේ මුද්‍රාකර ඇති දිනය යටතේ අසුරා ඇති සංසරණ තීරුව යටතේ පොතේ ප්‍රතිග්‍රහණ අංකය පරීක්ෂා කර අදාල පාඨක බලපත්‍රය ඉවතට ගෙන පාඨක බලපත්‍රයේ තිබෙන පොත් තුණ්ඩුව පොතේ ඇති පසුම්බියෙහි රඳවයි. පසුව පාඨක බලපත්‍රය අදාල පාඨකයාට ලබා දීමෙන් මෙම ග්‍රන්ථ සංසරණ ප්‍රමිතිය අවසන් වන බව විස්තර කර ඇත.

**ස්වයංක්‍රීයකරණ ග්‍රන්ථ සංසරණ ප්‍රමිති (Automation Circulation Standards)**

පරිගණකය ආශ්‍රය කර ගනිමින් පුස්තකාල ග්‍රන්ථ සංසරණ කටයුතු ස්වයංක්‍රීයව සිදු කර ගැනීමට වර්තමාන පුස්තකාලවල නව ප්‍රවණතාවයක් දක්නට ඇත. ඒ අතර කේත අංක (Barcode) ක්‍රමය භාවිත කරමින් තම පුස්තකාල ග්‍රන්ථ සංසරණ ක්‍රමයේ දී දෘඩාංග (Hardware) මෘදුකාංග (Software) භාවිත කරමින් තම කටයුතු සිදු කරයි. ප්‍රධාන වශයෙන්ම කේත අංකකරණ යන්ත්‍ර භාවිත කරමින් මෘදුකාංග හරහා මෙම ග්‍රන්ථ සංසරණ කටයුතු සිදු කරයි.

වර්තමානයේ දී ලොව තුළ බිහි වී ඇති පුස්තකාල විවෘත ප්‍රභව මෘදුකාංග වල ද මෙම පහසුකම දක්නට ලැබේ. උදාහරණ ලෙස කොහා (KOHA) පුස්තකාල විවෘත ප්‍රභව ස්වයංක්‍රීයකරණ මෘදුකාංගය දක්නට ඇත. ලොව පුරා බොහෝමයක් රටවල පුස්තකාල සඳහා මෙම ක්‍රම භාවිත කරන අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාල ද ඒ සඳහා නැඹුරු වීමක් පෙන්නුම් කරයි. රුහුණු විශ්වවිද්‍යාල පුස්තකාලය (KOHA) වලින් සකසා ගත් (ISURU) මෘදුකාංගය භාවිත කරයි. මීට අමතරව වාණිජමය පුස්තකාල මෘදුකාංගවල ද මෙම පහසුකම දැක ගත හැක.

## අක්ෂර පරිවර්තනය පිළිබඳ ප්‍රමිති (Standards of Transliteration)

මෙම ප්‍රමිති බොහෝ විට පුස්තකාලවල භාවිතයට ගනු ලබන්නේ පුස්තකාල තාක්ෂණික කටයුතු සඳහාය. සූචිකරණ කටයුතුවල දී බොහෝ දුරට මෙම අක්ෂර පරිවර්තන ප්‍රමිති භාවිත කරයි. පත්‍රිකා සූචිය භාෂා දෙකකින් දැක්වීමේ දී ප්‍රධාන භාෂාවේ භාවිත කරන අක්ෂර සඳහා අනිකුත් භාෂාවේ භාවිත වන අකුරු නිසි ප්‍රමිතියකට අනුව භාවිත කිරීම

මෙහි දී සිදු වේ. බොහෝ දුරට ISO ආයතනය සමඟ විවිධ රටවල් එක්වී මෙම ප්‍රමිති සකස් කර තිබෙන බව අන්තර්ජාල ගවේෂණයේ දී පැහැදිලි වන කරුණකි.

උදාහරණ වශයෙන් ප්‍රමිති කිහිපයක් හඳුනාගත හැකිය.

- ISO 9 - Transliteration of Cyrillic
- ISO 233 - Transliteration of Arabic
- ISO 259 - Transliteration of Hebrew
- ISO 843 - Conversion of Greek
- ISO 3602 - Romanization of Japanese Kauai
- ISO 7098 - Romanization of Chinese
- ISO 9984 - Transliteration of Georgian
- ISO 9985 - Transliteration of Armenian

මෙම ප්‍රමිති ජාතික ජාත්‍යන්තර වශයෙන් භාවිතයට ගන්නා ප්‍රමිතීන් වන අතර පුස්තකාල සඳහා වෙනම ම ජාත්‍යන්තර වශයෙන් ප්‍රමිති හඳුනා ගැනීම අපහසු කටයුත්තකි. නමුත් දේශීය වශයෙන් රටවල් විසින් තමන්ට ආවේණික වූ ප්‍රමිති ඒ ඒ රටට අවශ්‍යතා පරිදි සකසා ඇත. එසේම ISO/TEI 10646 නම් වූ යුනිකෝඩ (Unicode) ප්‍රමිතිය ද “ISO/TC46/sc2 : conversion of written languages” නම් ප්‍රමිතිය බොහෝ දුරට පුස්තකාලවල කටයුතු සඳහා භාවිතයට ගත හැකි බව පෙන්වාදිය හැකිය.

දේශීය වශයෙන් ජාතික පුස්තකාල මට්ටමින් බොහෝ අක්ෂර ප්‍රමිති නිර්මාණය වී ඇති බව පෙනී යන කරුණකි. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය “Order of Alphabet : System of Transliteration” නමින් වෙනම ම අක්ෂර පරිවර්තන ප්‍රමිතියක් භාවිත කරයි. මෙම ක්‍රමය බොහෝ දුරට ජාතික පුස්තකාලයේ සියලුම තාක්ෂණික කටයුතු සඳහා භාවිත කරන බව පෙන්වා දිය හැකිය.

## සාධිකාරී ලේඛන පිළිබඳ ප්‍රමිති (Standards of Authority Documents)

සාධිකාරී ලේඛන පුස්තකාල තාක්ෂණ කටයුතු සිදු කරගැනීම සඳහා මහඟු කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය වන්නේ පුස්තකාලයේ සුචිකරණ කටයුතු, අනුක්‍රමණිකාකරණය, සාර සංග්‍රහකරණය, ග්‍රන්ථ නාම සම්පාදනය වැනි කටයුතු සඳහාය.

මූලිකවම සහ ප්‍රධානතම පුස්තකාල සාධිකාරී ලේඛන ප්‍රමිති ලෙස ඇංග්ලෝ ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහ හඳුන්වා දීමට හැකිය. එහි (AACR - II) ඇංග්ලෝ ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහයේ 22, 23, 24, 25 පරිච්ඡේද වෙන් වන්නේ සාධිකාරී ප්‍රමිති සඳහාය.

22 පරිච්ඡේදය - පුද්ගල නාම ශීර්ෂ
23 පරිච්ඡේදය - භූගෝලීය නාම
24 පරිච්ඡේදය - ආයතන නාම ශීර්ෂ
25 පරිච්ඡේදය - ඒකීය ග්‍රන්ථ නාම

යන ප්‍රමිති වැදගත්ම සාධිකාරී ප්‍රමිති ලෙස පෙන්වා දිය හැක. ඩිවි දශම වර්ගීකරණයේ ද දක්වා ඇත්තේ විෂය නාම සාධිකාරී ප්‍රමිතියකි. අනෙකුත් සියලුම වර්ගීකරණ ප්‍රමිති, MARC, Dubline Core වැනි සියලු ප්‍රමිතීන් ද සාධිකාරී ප්‍රමිති වශයෙන් පෙන්වා දිය හැකිය.

කොංග්‍රස් පුස්තකාලය සාධිකාරී ප්‍රමිතියක් භාවිත කරන බව පෙනී යන කරුණකි. එය (On -line) මාර්ග ගත ක්‍රමයට ද ලබා ගත හැකිය. එය නම් කර ඇත්තේ “Library of Congress Authorites” ලෙසය. එහි

- Subject authority
- Name authority
- Title authority
- Name/title authority
- Key word authority

ලෙස මාර්ග ගත ක්‍රමය යටතේ එම සාධිකාරී ප්‍රමිති සකස් කර ඇත. දේශීය වශයෙන් විමසා බැලීමේ දී බොහෝ විට තම රටට පොදුවේ භාවිතයට ගත හැකි සාධිකාරී ලේඛන ප්‍රමිති සකස් කර ඇත. ශ්‍රී ලංකාවේ මහාචාර්ය පියදාස රණසිංහයන් ප්‍රමුඛ කමිටුවක් සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය එක්ව සාධිකාරී ලේඛන දෙකක් සකසා ඇත.

**අ. කර්තෘ නාම සාධිකාරී ලේඛනය (සිංහල)**

මෙම සාධිකාරී ලේඛනය අනුරාධපුර යුගයේ සිට විසිවන සියවස මැද භාගය දක්වා වූ කාලය තුළ භාවිත කළ කර්තෘ නාම පිළිබඳ යම් සාධිකාරී ප්‍රමිතියක් ගොඩනැංවීම සඳහා උත්සහ ගෙන ඇත. 2005 දී පළ කළ මෙම ප්‍රමිතිය කර්තෘ නාම අකාරාදී ව සංවිධානය කර ඇත. එම කර්තෘ නාමයන්ට අදාලව නියමිත කාලය ද ඉදිරියෙන් සඳහන් කරයි. මහාචාර්ය පියදාස රණසිංහයන්ගේ සභාපතීත්වයෙන් යුතු කමිටුවක් මඟින් සකස් කර ඇති ප්‍රමිතියකි. බොහෝ දුරට පුස්තකාලවල තාක්ෂණික කටයුතු සඳහා භාවිත කළ හැකි ප්‍රමිතියක් ලෙස පෙන්වා දිය හැකිය.

**ආ. ග්‍රන්ථ නාම සාධිකාරී ලේඛනය (සිංහල)**

මෙම ප්‍රමිතිය තුළ අන්තර්ගතය සකස් වී ඇත්තේ අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය දක්වා වූ ග්‍රන්ථ නාමයෙනි. අකාරාදී පිළිවෙළ අනුගමනය කර ඇති මෙහි

ග්‍රන්ථ නාම පිළිබඳව සාධිකාරී ප්‍රමිතියක් ආකාරයට සකසා ඇත. 2008 දී පළ කර ඇති මෙම ප්‍රමිතිය ද තාක්‍ෂණික කටයුතු සඳහා භාවිත කළ හැකි ප්‍රමිතියකි.

මෙලෙස විශාල ප්‍රමාණයක දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති ලොව පුරා පුස්තකාල ක්ෂේත්‍රය තුළ හඳුනාගත හැකිය. දියුණු වන නව තොරතුරු තාක්ෂණයත් සමඟ පුස්තකාල ප්‍රමිති ද නව දිශාවකට යොමු වී ඇති බව පෙනී යන කරුණකි. තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම්ව නවීන පුස්තකාල දැනුම සංවිධාන ප්‍රමිති බිහිවීමේ ප්‍රවණතාවක් දැකිය හැකිය.

**නිගමනය**

මානවයා එදා මෙදාතුර ලොවට දායාද කළ දැනුම එක් රැස්කර, මනාව සංවිධානය කර මහජනයාගේ තොරතුරු අවශ්‍යතාව ඉටු කිරීමට අවැසි දැනුම් කෝෂ්ටාගාරයක් ලෙස පුස්තකාලය හැඳින්වේ. පුස්තකාල දැනුම සංවිධානය පිළිබඳ ප්‍රමිති පුස්තකාලයකට අත්‍යවශ්‍ය වේ. වර්ගීකරණය, සූචිකරණය, අනුක්‍රමණිකාකරණය, විෂය ශීර්ෂ ලැයිස්තු, ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පිළිබඳ ප්‍රමිති, ග්‍රන්ථ සංසරණය, අක්ෂර පරිවර්තන ක්‍රම සහ සාධිකාරී ලේඛන වැනි තාක්ෂණික හා ප්‍රලේඛන සේවා ප්‍රමිති වැදගත් කොට සැලකේ. පුස්තකාලයක් ප්‍රමාණාත්මකව වැඩෙත්ම එහි තිබිය යුතු ගුණාත්මකබව ඉහළ නංවා ගැනීමට ද දැනුම සංවිධාන ප්‍රමිති වැදගත් වේ. පුස්තකාලයක තිබෙන සාර්ථකත්වය රඳා පවතින්නේ එකතුව මනාව කළමනාකරණය කිරීමෙන්ය. ඒ සඳහා ඉහත දක්වූ දැනුම සංවිධාන ප්‍රමිති උපකාරී කර ගනී. මේ පිළිබඳව තවත් ගැඹුරින් කරුණු විග්‍රහ කළ හැකි අතර ම යාවත්කාලීනව කාලයෙන් කාලයට බිහිවන නව ප්‍රමිති මොනවාදැයි විමර්ෂණය කිරීමේ හැකියාව ද පවතී.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ගුණසේකර, ධනපාල (1998)*පුස්තකාල සේවාවේ මූලිකාංග*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (2008)*කර්තෘ නාම සාධිකාරී ලේඛනය*, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (2008)*ග්‍රන්ථ නාම සාධිකාරී ලේඛනය*, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ.

රණසිංහ, පියදාස (2007)*විෂය සූචිකරණය හා අනුක්‍රමණිකාකරණය*, කර්තෘ, කැලණිය.

රණසිංහ, පියදාස (පරි.) (2011),*ඩිවි දශම වර්ගීකරණයේ න්‍යාය හා භාවිතය*, කර්තෘ ප්‍රකාශන, රාගම.

වනිගසූරිය, ප්‍රියන්වදා (2005)"සුචිකරණයේ නව ප්‍රවණතා පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක්", *පුස්තකාල හා විඥාපන විද්‍යා ලේඛන සමුච්චය*, පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය, කැලණිය.

වීරසූරිය, ඩබ්ලිව්.ඒ. (2007)"විශ්ව දශම වර්ගීකරණයේ අපූර්වත්වය පිළිබඳ විමර්ශනයක්", *පුස්තකාල හා විඥාපන විද්‍යා ලේඛන සමුච්චය*, පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය, කැලණිය.

Dawning, Mildred Harlow (1981), *Introdution to cataloguing and classifiacation*, Mc Farland, North Carolina.

Gernert, Leigh (2003), *A Text of cataloguing*, Dominant publisher, New Delhi.

Harvey, Ross and Hider, Philip (2004), *Organization knowledge in a global socity*, Quick print, Wagga Wagga.

Khan, M.A. (1991), *Cataloguing and library automation*, Cosmo, New Delhi.

Khochar, R.S. (1999), *Modern cataloguing*, Discovery publish house, New Delhi.

Kumar, Krishan (1979), *Theory of classification*, Hidustan offset printers, Delhi.

Ohdear, A.K. and Sengupta, B. (1977), *Library classification*, The World Press private Ltd., Calcutta.

Whnar, Bohdan S. (1964), *Introduction to cataloguing and classification*, librarie unlimited, Colorado.

Library of Congress authorities (20.10.2012), [online],
Available at: http://authorities.loc.gov.

Transliteration standards and Unicode (20.10.2012), [online],
Available at: http://czyborra.com/ translit/header.html